# බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනය
# மேல்மாகாண அழகியற் கலையரங்கம்
# WESTERN PROVINCE AESTHETIC RESORT

275/74, ස්ටැන්ලි විජේසුන්දර මාවත, කොළඹ 07.
ஸ்டான்லி விஜேசுந்தர மாவத்தை, கொழும்பு 07
275/74 Stanley Wijesundara Mw, Colombo 07.

WPAR

දුරකථන/தொலைபேசி/Telephone කාර්යාලය/அலுவலகம/Office 0112 081500
ෆැක්ස්/பெக்ஸ்/Fax 0112 081502 0112058775
සභාපති/தலைவர்/Chairman 0112 081501
අධ්‍යක්ෂ/பணிப்பாளர்/Director 0115 929344

E-mail:aestheticresortwp@gmail
Web:www.cr.wp.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My No . WP/AR/04/31/001

ඔබේ අංකය / உமது இலக்கம் / Your No

දිනය / திகதி / Date 2023.02.18

බස්නාහිර පළාත් අධ්‍යාපන ලේකම්තුමා මගින්,

සියලු ම බස්නාහිර පළාත් පාසල් විදුහල්පතිවරුන් වෙත

<u>‘තියටර් සෙවන් ළමා නාට්‍ය ඇගයීම 2023’</u>

‘තමා වෙසෙන ලෝකය තුළ තමා කවුද, ජීවත්වීමේ දී අනෙකාට සාපේක්ෂව තමාට කළ හැකි සහ නොකළ හැකි දේ මොනවාද, කළ යුතු සහ අත්හැරිය යුතු දේ මොනවා ද , ඌණ පෞරුෂ ලක්ෂණ සහිතව ජීවත් වීමේ දී තමාට මුහුණ දීමට සිදුවන ගැටලු මොනවාද යන කරුණු ව්‍යාංගයෙන් ඉඟිකෙරෙන ක්‍රීඩාශීලී ප්‍රවේශයක් ඔස්සේ ප්‍රීතිමත් අවසානයක් සහිතව ළමයාට විනෝදාස්වාදය ලබාදෙන සිදුවීම් අන්තර්ගත ක්‍රියාවලිය ළමා නාට්‍යය වේ.’ මෙම නිර්ණායක අනුව යමින්

බස්නාහිර පළාත් අධ්‍යාපන සංස්කෘතික හා කලා කටයුතු ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ අමාත්‍යාංශය, බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවසහ කොළඹ 07 බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනයේ තියටර් සෙවන් රඟහල එක්ව බස්නාහිර පළාත් පාසල්වල අධ්‍යාපනය හදාරණ දරුවන්ගේ සෞන්දර්යාත්මක කුසලතා ඔප්නංවාලන අරමුණින් ‘තියටර් සෙවන් ළමා නාට්‍ය ඇගයීම 2023’ සංවිධානයකර ඇත. මෙම ඇගයීම පිළිබඳ සියලුම තොරතුරු මේ සමග අමුණා ඇත.

02. ඒ අනුව එම ඇගයීම සඳහා 2023.02.20 දින සිට 2023.03.31 දින දක්වා දරුවන් විසින් නිර්මාණය කරන ලද නාට්‍ය අත්පිටපත් කැඳවනු ලැබේ.

03. තෝරා ගන්නා ලද අත්පිටපත් නාට්‍යය නිෂ්පාදනය කිරීම සඳහා යොමු කරනු ලබන අතර ජයග්‍රාහී කණ්ඩායම් සඳහා මුදල් ත්‍යාග, සම්මාන සහ සහතිකපත් ප්‍රදානය කිරීමට නියමිත ය.

04. ජයග්‍රහණය නොකරන ලද නමුත් කුසලතා දක්වන දරුවන් සඳහා විශේෂ ඇගයීමක් ද සහභාගීවන සියලු දෙනාට ම සහභාගීත්ව සහතිකයක් ද පිරිනැමීමට නියමිත ය.

05.දරුවන්ගේ සුන්දර ලෝකය ගොඩ නැගීම සඳහා ඔවුන් දිරිමත්කර මෙම ඇගයීමට සහභාගී කරවන මෙන් ගෞරවයෙන් ආරාධනාකර සිටින අතර ‘තියටර් සෙවන් ළමා නාට්‍ය ඇගයීම 2023’සඳහා ඔබේ කාරුණික සහයෝගය ද ගෞරවයෙන් අපේක්ෂාකර සිටිමු.

ශ්‍රියන්ත මෙන්ඩිස්
සභාපති
තියටර් සෙවන් රඟහල,
බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනය,
කොළඹ 07